# ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 'බෝධිය' සුරැකීමේ ජාතික හා ජාත්‍යන්තර ව්‍යාපෘතිය

**රන්ජනී මලවි පතිරණ**[1]
*[1]පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*
*mpranjanee@gmail.com

බෝධිය යනු, 'අවබෝධය', 'බුද්ධත්වය', 'සර්වඥතා ඥානය' යනාදී අර්ථ දෙන පදයකි. සිදුහත් බෝසතුන්ට බුද්ධත්වය ලබා ගැනීමේ දී වැඩසිටීමට ආධාර වූ බෝධි වෘක්ෂය, (අශ්වත්ථ වෘක්ෂය) 'බෝධීන් වහන්සේ' යනුවෙන් සලකනු ලබන්නේ බුදුරජාණන් වහන්සේ ගෞරව කළ බැවිනි. එබැවින් බෝධි වෘක්ෂය බෞද්ධයන්ගේ පූජනීය වෘක්ෂයක් බවට පත්වී ඇත. 'බෝධිය' නමැති සංකල්පය මගින් බුදුරජාණන් වහන්සේ ද බුද්ධත්වය ද බෝධි වෘක්ෂය නැමැති බුද්ධ පාරිභෝගික වස්තුව ද සංකේතවත් වේ. සමස්ත බෞද්ධ ඉතිහාසය තුළ ම එම බෝධිය සුරැකීමට කටයුතු කළ අය අතර මෑත යුගයේ ශ්‍රේෂ්ඨතම පුද්ගලයා වන්නේ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා ය. තම ජීවිතයෙන් බෞද්ධ ප්‍රතිපත්ති අර්ථාන්විත කරන්නට උත්සාහ දැරූ එතුමාගේ එම ක්‍රියා පිළිවෙත් පිළිබඳව හෙළි කොට නූතන සමාජයට එමගින් ලබා ගත හැකි ආදර්ශ පෙන්වා දීම මෙම පත්‍රිකාවේ අරමුණ යි. දහනව වන සියවස යනු අදට වඩා බෙහෙවින් වෙනස් යුගයකි. බුදුරජාණන් වහන්සේ, බෞද්ධයෙකු විසින් දැක වැඳ පහන් සංවේගය උපදවා ගත යුතු යැයි සඳහන් කළ ස්ථාන සතරෙන් එකක් වූ ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිහිටි බුද්ධගයාව බෞද්ධයාගෙන් ගිලිහී තිබූ යුගයක එම පුණ්‍යභූමිය බෞද්ධ උරුමයක් බවට පත් කිරීමට පමණක් නොව බුදුදහමෙහි අගය ලෝකයට පෙන්වා දීමට 1891 වර්ෂයේ දී එතුමා විසින් ආරම්භ කරන ලද 'මහා බෝධි සමාගම' මගින් විශාල සේවාවක් සිදුකරන ලදී. මේ අනුව 'බෝධිය' රැක ගැනීමට එතුමා අවි ආයුධ වියුක්ත අරගලයක යෙදුණේය. එහි ප්‍රතිඵලය වූයේ ලෝකය තුළ බුදුදහම පිළිබඳව ඇති වූ පුනර්ජීවය යි. ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පවත්වමින්, සඟරා පුවත්පත් පළ කරවා බෙදා හරිමින්, යුරෝපා රටවලට පවා ගොස් දේශන පවත්වමින්, තම සමස්ත ජීවිතය ම බුදුදහම වෙනුවෙන් කැප කළ එතුමා තුන් කල්හි ම ආදර්ශවත් අමරණීය චරිතයකි. ඉන්දියාවේ බෞද්ධ විප්ලවයක් සිදු කළ අම්බෙඩ්කාර්තුමා පවා බුදුදහම වැළඳ ගත්තේ එතුමා නිසා ය. එතුමාගේ චරිතාපදානයන් ඇතුළු ද්විතියික ග්‍රන්ථ හා වාර්තා සටහන් ආදිය අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය වෙයි. එතුමා විසින් අපට රැක දුන් 'බෝධි සංකල්පය', බෝධීන් වහන්සේ හා බුද්ධගයාව රැක ගැනීම බෞද්ධයා සතු වගකීමකි. ඒ පිළිබඳව බෞද්ධ ලෝකය අවදි කිරීමට හැකි වීම මෙම පත්‍රිකාවෙන් අපේක්ෂිත ප්‍රතිඵලය යි.

මුඛ්‍ය පද ඃ අනගාරික ධර්මපාලතුමා, බෝධිය, බුද්ධගයාව, බුදුදහම, බෞද්ධයා